

# තනි වූ අලි පැංචා



ඩී.එම්.සුහන්සී අයජි විතුම්සා දිසානායක

# තනිවූ අලි පැංචා


**ඩී.එම්. සුහන්සී අයජී විතුම්සා දිසානායක**

**කර්තෘ**



පළමු දිගහැරීම



මහ/මහාමායා බාලිකා විදුහල

1 ශ්‍රේණිය A



2026.05.10

ISBN 978-624-208-967-6

# පිදුම

**මහ/ මහාමායා බාලිකා විද්‍යාලයේ 1- A ශ්‍රේණියේ පංති භාර රුවිනි රත්නායක ගුරු මැණියන්ටත්, මං පුංචි කාලේ ඉඳන් මන් හදලා කියන කතන්දර අහගෙන ඉන්න මගේ අම්මට, අප්පච්චිට, අත්තම්මට ආදරයෙන් පුදමි.**



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පුජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි.  මේ සදහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,

ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.

සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු  දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමී.

ප්‍රදීප් නිලංග දෑල,


දියවඩන නිලමේ,

ශ්‍රී දළදා මාලිගාව

2026.05.10

එකමත් එක කාලේක කන්දක් පාමුල විශාල කැලෑවක් තිබුණා. මේ කැලෑවේ එක එක වර්ගයේ නපුරු සත්තු, අහිංසක සත්තු ගොඩක් ජීවත් වුණා. මේ සත්තු ඔක්කොම හරිම සමගියෙන් සතුටෙන් හිටියා.





මේ කැලේ එක පැත්තක අලි අම්මෙකුයි, අලි තාත්තෙකුයි, පුංචිම පුංචි අලි පැටියෙකුයිත් ජීවත් වුණා. එයාලා තුන්දෙනාම එකට සතුටින්, නිදහසේ කාටවත් කරදරයක් නොවී ජීවත් වුණා. අලි අම්මාත් අලි තාත්තාත් තමන්ගේ පුංචි පැටියාට කැලේ ජීවිතේ ගැන බොහෝ දේ ඉගැන්වුවා. අනෙකුත් සතුන්ට කරුණාවෙන් හැසිරෙන හැටි, මේ සියල්ලම පැටියට කියා දුන්නා.





එක දවසක් මේ කැලේට ගස් කපන්න නපුරුම



නපුරු මිනිස්සු කට්ටියක් ආවා. එයාලා ගස් කපන්න සතුන්ට වෙඩි තියලා කැලෑවෙන් පන්නන්න පටන් ගත්තා. සත්තු හැමෝම බයවෙලා එක එක පැත්තට දුවන්න ගත්තා. අර අලි අම්මයි තාත්තයිත් පැටියව අරන් දිව්වා.



මෙහෙම දුවන අතරේ මේ පුංචි අලි පැටියා අතරමං වුණා. තනිවුන පුංචි අලි පැටියා තනියම විශාල කැලෑවේ ඉස්සරහටම ගියා. මෙයා දන්නෙම නැතුව කැලේ අනිත් පැත්තටම ගිහින්. එයාට එයාගේ අම්මයි තාත්තවයි හොයා ගන්න බැරි වුණා. එයා " අම්මේ..., තාත්තේ...., " කිය කියා කෑගහන්න ගත්තා. අලි පැටියා හොදටම අඬන්න ගත්තා.
අලි අම්මයි තාත්තයිත් පැටියව එයාලා හිටපු පැත්තේ හැම තැනම හෙව්වත් හොයා ගන්න බැරිවුණා.






මෙහෙම ටික දවසක් ගත වුණා. පුංචි අලි පැටියා අඩ අඩ තනියම කාලය ගත කළා.

මෙහෙම ඉන්නකොට වැස්ස නැතුව කැලෑවට නියං කාලයක් උදා වුණා. සත්තුන්ට කන්න කෑම නැතුව ගියා. බොන්න වතුර නැතුව ගියා. ගස්වැල් මැලවිලා. සමහර ගස් මැරිලා ගිහින්.






පුංචි අලි පැටියත් වතුර නැතුව අමාරුවෙන් හිටියා. එයා ළඟ තිබුණු වතුර වලවල් වල වතුර ටිකත් ඉවර වෙලා. අලි පැටියට කන්න තිබුණු ගස් කොළන් ටිකත් වේලිලා ගිහින්. දැන්නම් හරිම අමාරුයි. වතුර හොයන්න යන්නත් බෑ. අලි පැටියට හුස්ම ගන්නත් අමාරුවෙන් බිම නිදාගෙනම හිටියා.





මේ අතර තමන්ගේ පැටියා නැතුව දුකින් හිටපු අලි අම්මටයි තාත්තටයිත් බොන්න වතුරවත්, කන්න කොළයක්වත් තිබුණේ නැහැ. ඒ දෙන්නත් වතුර හොයා හොයා හැම තැනම ගියා.





කැලේ එයාලා හිටපු පැත්තේ සතුන් එක්කෙනා දෙන්නා වතුර, කෑම නැතුව වැටෙන්න ගත්තා. හුස්ම ගන්නෙත් නැහැ. සමහර සත්තු හිමින් හිමින් කැලේ අනිත් පැත්තට යන්න පටන් ගත්තා. අලි අම්මයි තාත්තයිත් අනිත් සත්තු එක්ක ඒ ලොකු කැලේ අනිත් පැත්තට යන්න එකතු වුණා.



වතුර හොයන් කැලේ අනිත් පැත්තට ගිය අලි අම්මටයි තාත්තටයි හිදිලා ගිය වතුර වැලක් ළඟ අලි පැටියෙක් වැටිලා ඉන්නවා දැක්කා. මේ දෙන්නා හිමින් හිමින් ළඟට යනකොට දැක්කා ඒ එයාලගේ පුංචි පැටියා කියලා. අම්මටයි තාත්තටයි පැටියා දැකලා සතුටු වුණත් පැටියා හිටියේ හරිම අමාරුවෙන්. අම්මයි තාත්තයි හොදටම බයවුණා. අලි තාත්තා ටිකක් ඈතට වෙන්න තිබුණු වතුර වලකින් වතුර හොඩෙන් ගෙනත් පුංචි පැටියට දුන්නා. පැටියා හිමින් හිමින් ඇස් ඇරියා.



ඉර පායලා අලුත් දවසක් උදා වුණා. නියං කාලය ඉවර වෙලා දවස් ගණනකට පස්සේ කැලෑවට වැස්ස වැටුණා. සතුන්ට හරිම සතුටුයි. ඇතිවෙන්න වතුර බිව්වා.අලි අම්මයි තාත්තයිත් පැටියා එක්ක වතුර ඇතිවෙන්න බිලා වතුරේ සෙල්ලම් කරා. මෙයාලට හරිම සතුටුයි.





වතුර හොයන් අපු සත්තු හැමෝම එක්ක අම්මයි තාත්තයි තමන්ගේ පැටියාවත් අරන් එයාලට පුරුදු පැත්තටම ගියා. වේලිලා තිබුණු ගස් වල කොළ ඇවිත් මල් පිපෙන්න පටන් ගත්තා.

සත්තු හැමෝම හරිම සතුටෙන් නිදහසේ කලින් වගේම ජීවත් වුණා.





# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වු වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **“හේමමාලා උපහාර”** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)